# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2394/67 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021(III)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 45 වන වගන්තිය සමඟ කියවිය යුතු, ඒ පනතේ 71 වන වගන්තිය යටතේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟත්වය ඇතිව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2024 අංක 04 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ බැංකු - මූලික) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග, පනත යටතේ යම් බලයලත් තැනැත්තකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදුකර ගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

3. (1) (2) වන අනුනියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් සමාගමක් විසින්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා වන බලපත්‍රයක් සඳහා, 2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්‍රකරණ, බලය පැවරීමේ සහ සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල සහ 2022 අංක 1 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ) නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් සහ ආකාරයෙන් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) (1) වන අනුනියෝගයේ සඳහන් කරන ලද සමාගමක් පහත පරිදි විය යුතු යː-

(අ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සහ බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස බලපත්‍රලාභී සමාගමක්වන, කොළඹ වරාය නගරය ශාඛාව හරහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීමට කැමැත්තක් දක්වන සමාගමක්;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචිකර ඇති, බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස බලපත්‍රලාභී සමාගමක්වන, කොළඹ වරාය නගරය ශාඛාව හරහා කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට කැමැත්තක් දක්වන සමාගමක්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ අක්වෙරළ සමාගමක් ලෙස ලියාපදිංචිකර ඇති, වෙනත් යම් රටක යම් නීතියක්, අධිකාරපත්‍රයක්, ව්‍යවස්ථාවක්, සාංගමික ව්‍යවස්ථාවලියක් හෝ සමාගම සංස්ථාපිත කරන හෝ ඒ සංස්ථාපිත කිරීම අර්ථ නිරූපණය කරන වෙනත් සාධනපත්‍රයක් යටතේ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීමට බලපත්‍රලාභී සමාගමක් වන එහෙත් බැංකු පනත යටතේ බලපත්‍රලාභී සමාගමක් නොවන, කොළඹ වරාය නගරය ශාඛාව හරහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීමට කැමැත්තක් දක්වන සමාගමක්.

4. 3 වන නියෝගයේ සඳහන් කරන ලද සමාගමක් විසින් කොළඹ වරාය නගරය ශාඛාව හරහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස පහත දැක්වෙන අවශ්‍යතා සපුරාලනු ලැබිය යුතු යː-

(අ) 3 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ සඳහන් කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වන විට දී, එම සමාගම විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීමට නියමිත කොළඹ වරාය නගරය ශාඛාව සඳහා, එ.ජ.ඩො. මිලියන 15ක හෝ යම් නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදල් ප්‍රමාණයක පැවරූ ප්‍රාග්ධනයක් සපයනු ලැබිය යුතු ය; සහ

(ආ) 3 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ (ආ) හෝ (ඇ) ඡේදයේ සඳහන් කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වන විට දී, එම සමාගම විසින් -

(i) එම සමාගමට කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ කොළඹ වරාය නගරය ශාඛාවක් පිහිටුවීමට ස්වකීය අවසරය ලබා දී ඇති බව සනාථ කරමින් සමාගම සංස්ථාගත කරන ලද රටෙහි නියාමන අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකයක්; සහ

(ii) කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යාමේ දී කොළඹ වරාය නගරය ශාඛාව විසින් දරනු ලබන සියලු බැඳීම් සහ වගකීම් පියවීමට අවශ්‍ය විය හැකි අරමුදල් එය විසින් සපයන බවට එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිඛිත පොරොන්දුවක්,

කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. 3 වන නියෝගය යටතේ ලැබුණු ඉල්ලීමක් සලකා බැලීමෙන් පසුව, කොමිෂන් සභාව විසින්, පනතේ 42 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා එම ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු සලස්වන ලෙසට, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත නිර්දේශ කළ යුතු අතර, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟත්වය ඇතිව, එම බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්ව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා එම ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

6. (1) 5 වන නියෝගයේ දක්වා ඇති පරිදි බලපත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව, එම බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි නියමවලට සහ කොන්දේසිවලට යටත්ව සහ මේ නියෝගවල විධිවිධානවලට යටත්ව -

(අ) එම ඉල්ලුම්කරු 3 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ (අ) ඡේදයේ සඳහන් කරන ලද සමාගමක් වන විට දී, එම සමාගම විසින්, කොළඹ වරාය නගරය ශාඛාවක් හරහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත විය හැකි ය.

(ආ) එම ඉල්ලුම්කරු 3 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද සමාගමක් වනවිට දී, එම සමාගම විසින්, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ කොළඹ වරාය නගරය ශාඛාවක් හරහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවිය හැකි ය; සහ

(ඇ) එම ඉල්ලුම්කරු 3 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ (ඇ) ඡේදයේ සඳහන් කරන ලද සමාගමක් වන විට දී, එම සමාගම විසින්, එම සමාගම සංස්ථාගත කරනු ලැබූ රටේ නියාමන අධිකාරිය විසින් අවසර දෙනු ලබන පරිදි කොළඹ වරාය නගරය ශාඛාවක් හරහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවිය හැකි ය.

(2) (1) වන අනුනියෝගයේ සඳහන් කරන ලද පරිදි කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ යම් කොළඹ වරාය නගරය ශාඛාවක් සම්බන්ධයෙන් ද, එම කොළඹ වරාය නගරය ශාඛාව අදාළ බැංකුවේ "කොළඹ වරාය නගරය ශාඛාව" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

7. 3 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ සඳහන් කරන ලද සමාගමක් විසින්, 4(අ) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පැවරූ ප්‍රාග්ධනය සියලු අවස්ථාවන්හි දී අඛණ්ඩ පදනමකින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

8. කොළඹ වරාය නගරය ශාඛාවේ වත්කම්, වගකීම් සහ ගනුදෙනු ඒ සම්බන්ධයෙන් දැඩි ආරක්ෂණයක් සහිතව ශ්‍රී ලංකාව තුළ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක මෙහෙයුම් කටයුතුවලින් දුරස්ථභාවයක් ඇතිව කරගෙන යනු ලැබිය යුතු අතර, ගිණුම් හිමියකුගේ අරමුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම එම ගිණුම් හිමියා විසින් සිදුකරනු ලබන ස්වේච්ඡා ක්‍රියාවක් විය යුතු ලෙසට සීමා කරනු ලැබේ. තවද, කොළඹ වරාය නගරය ශාඛාව විසින්, ගිණුම් හිමියකු වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කිරීම සඳහා අවසර නොලැබේ.

9. කොළඹ වරාය නගරය ශාඛාවේ ගිණුම්හිමියකු -

(අ) ශ්‍රී ලංකාවෙහි ප්‍රභවය ඇති භාණ්ඩ අපනයනය කිරීමේ ව්‍යාපාරයක නිරතවන සහ එසේ අපනයනය කිරීමට නියමිත භාණ්ඩවලට අදාළව (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තත්කාර්ය සඳහා රේගු ප්‍රකාශනයක් ගොනු කරන අවස්ථාවක දී; සහ

(ආ) අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීතිවල අර්ථානුකූලව, ඒ රීති යටතේ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබීමට සුදුසුකම්ලත් දේශීය සැපයුම්කරුවකු වන අවස්ථාවක දී,

එම ගිණුම් හිමියා එකී අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීතිවල පරිවර්තන අවශ්‍යතාවයන්ට යටත් විය යුතු ය.

10. (1) කොළඹ වරාය නගරය ශාඛාව විසින්, කොමිෂන් සභාව විසින් සහ බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කළට නිශ්චිතව දක්වනු ලබන යම් නියමවලට සහ කොන්දේසිවලට හෝ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීමට යටත්ව, පහත දැක්වෙන බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවිය හැකි යː-

(අ) යම් බලයලත් තැනැත්තකුගෙන් හෝ නිර්වාසික තැනැත්තකුගෙන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඉතිරි කිරීමේ, කාලීන සහ ඉල්ලුම් තැන්පතු භාර ගැනීම;

(ආ) යම් නිර්වාසික තැනැත්තකුගෙන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම;

(ඇ) යම් නිර්වාසික තැනැත්තකුට යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මූල්‍ය පහසුකමක් ලබාදීම;

(ඈ) යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වෙනත් යම් අක්වෙරළ ඒකකයක් සමග යම් ගනුදෙනුවක නිරතවීම;

(ඉ) යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් නිර්වාසික තැනැත්තකු සමග වෙනත් යම් ගනුදෙනුවක නිරතවීම;

(ඊ) මේ පනත යටතේ අදහස් කරන වෙනත් යම් ගනුදෙනුවක නිරතවීම; හෝ

(උ) ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟත්වය ඇතිව කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වෙනත් යම් ගනුදෙනුවක නිරතවීම.

(2) කොළඹ වරාය නගරය ශාඛාව විසින්, (1) වන අනුනියෝගයේ නිශ්චිතව දක්වා ඇති කවර හෝ බැංකු ව්‍යාපාර කටයුත්තක සිල්ලර වෙළෙඳ ගනුදෙනු ලෙස නිරත නොවිය යුතු ය.

(3) මේ අනුනියෝගයේ කාර්යය සඳහා, "සිල්ලර වෙළෙඳ ගනුදෙනු" යනු, එක්සත් ජනපද ඩොලර් ලක්ෂ පහට හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලකට නොවැඩි, අවස්ථාවෝචිත පරිදි, සමුච්චිත තැන්පතු ශේෂයක්, හෝ ණය සහ අත්තිකාරම් සහිතව, යම් බලයලත් තැනැත්තකු හෝ නිර්වාසික තැනැත්තකු විසින් කොළඹ වරාය නගරය ශාඛාව සමඟ සිදුකරන ගනුදෙනු වන්නේ ය.

11. කොළඹ වරාය නගරය ශාඛාව විසින්, සෑම විටම -

(අ) එ.ජ.ඩො. මිලියන 15ක හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලක පැවරූ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් නියම කරනු ලබන්නේ නම් මිස, මේ නියෝග යටතේ දක්වා ඇති අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරාලීමට යටත්ව, කොළඹ වරාය නගරය ශාඛාව සම්බන්ධයෙන් එහි මව් අස්ථිත්‍යයට අදාළ වන එහි ප්‍රභව දේශයේ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන ලද නියාමන අවශ්‍යතා යටතේ දක්වා ඇති පරිදි ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතු ය; සහ

(ඇ) එහි මෙහෙයුම් කටයුතු සඳහා පනතේ අර්ථ දක්වා ඇති පරිදි නිර්වාසික තැනැත්තන්ගෙන් අරමුදල් රැස්කරනු ලැබිය යුතු බව සැමවිටම සහතික කළ යුතු ය.

12. කොළඹ වරාය නගරය ශාඛාව විසින්, කොළඹ වරාය නගරය ශාඛාව සම්බන්ධයෙන් එහි මව් අස්ථිත්‍යයට අදාළවන සමස්ත නියාමන අවශ්‍යතාවලට අනුව දැඩි ආරක්ෂණ පදනමක් මත ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් (LCR) සහ ශුද්ධ ස්ථාවර අරමුදල් සම්පාදන අනුපාතයක් (NSFR) පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

13. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් නියම කරනු ලබන්නේ නම් මිස, ප්‍රභව දේශයේ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන ලද කොළඹ වරාය නගරය ශාඛාවේ මව් අස්ථිත්‍යයට අදාළවන නියාමන අවශ්‍යතාවලට යටත්ව, බාසල් රාමුව යටතේ අර්ථ දක්වා ඇති පරිදි අවම උත්තෝලන අනුපාතයක්, කොළඹ වරාය නගරය ශාඛාවේ මව් අස්ථිත්‍යය විසින් කොළඹ වරාය නගරය ශාඛාව සඳහා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

14. (1) කොළඹ වරාය නගරය ශාඛාවේ ප්‍රධාන විධායක නිලධාරී නිලය හෝ ප්‍රධාන අවදානම් නිලධාරී නිලය හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කටයුතු ඉටුකරන වෙනත් යම් නිලධාරී තනතුරක් සඳහාවන සෑම පත්කිරීමක් සඳහාම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු අතර, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාව විමසා එම අනුමැතිය ලබා දිය යුතුය.

(2) එම පත්කිරීම් සඳහා අනුමැතිය ලබා දීමේ දී, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්, එම තැනැත්තන් එම අදාළ තනතුරු දැරීමට සුදුසු සහ යෝග්‍ය වන්නේ ද යන්න නිශ්චය කළ යුතු ය.

(3) (2) වන අනුනියෝගයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගේ සුදුසුකම සහ යෝග්‍යතාවය නිශ්චය කිරීමේ දී, බැංකු පනතේ 42 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායක, එම නිර්ණායක කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත කටයුතු සිදුකරන ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කටයුතු ඉටුකරන වෙනත් යම් නිලධාරී තනතුරු සඳහාවන පත්කිරීම් සඳහා අදාළවන පරිද්දෙන්, අවශ්‍ය වෙනස්කම් සහිතව, එම පත්කිරීම් සඳහා අදාළ විය යුතු ය.

15. කොළඹ වරාය නගරය ශාඛාවේ තැන්පතු ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යොජනා ක්‍රමයෙන් ආවරණය නොවිය යුතු ය.

16. (1) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්, කොමිෂන් සභාව වෙත දන්වා, කොළඹ වරාය නගරය තුළ ස්වකීය මෙහෙයුම් කටයුතුවලට අදාළ යම් තොරතුරු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් ආකාරයකින් සහ ආකෘතියකින් ඉදිරිපත් කරන ලෙසට කොළඹ වරාය නගරය ශාඛාව වෙත නියම කරනු ලැබිය හැකි ය.

(2) කොළඹ වරාය නගරය ශාඛාව විසින් 3 වන නියෝගය යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලීමක් කරන අවස්ථාවේ දී ප්‍රකාශ කරනු ලබන හෝ පසුව මහ බැංකුව විසින් අනුමත කරනු ලබන යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එහි ගිණුම් පොත්, වාර්තා සහ ලේඛන පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

17. මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ.

"පැවරූ ප්‍රාග්ධනය" යන්නෙන්, 3 වන නියෝගයේ (2) වන අනුනියෝගයේ සඳහන් කරන ලද යම් සමාගමක ප්‍රධාන කාර්යාලය විසින් කොළඹ වරාය නගරය ශාඛාව වෙත පවරන ලද එක්සත් ජනපද ඩොලර්වලින් වූ ප්‍රාග්ධන මුදල හෝ නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වූ ඊට සමාන ප්‍රාග්ධන මුදල අදහස් වේ;

"බැංකු පනත" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ;

"ශාඛාව" යන්නෙන්, යම් සමාගමක මූලස්ථාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය හෝ හැර ව්‍යාපාර කටයුතු කරගෙන යන ස්ථානයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"2022 අංක 1 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ) නියෝග" යන්නෙන්, 2022 නොවැම්බර් මස 17 වන දින අංක 2306/54 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද 2022 අංක 1 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ) නියෝග අදහස් වේ;

"කොළඹ වරාය නගරය ශාඛාව" යන්නෙන්, පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බලපත්‍රලාභී සමාග මක ශාඛාවක් අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, පනත යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ;

"නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ, මහ බැංකුව විසින් "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යනුවෙන් නිශ්චය කරන ලද විදේශ ව්‍යවහාර මුදලක් අදහස් වේ;

"බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා" යන්නට, (සංශෝධිත පරිදි වූ) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ එම පදයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මූල්‍ය ආයතන" යන්නට, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති අර්ථයම තිබිය යුතු ය;

"ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රභව දේශයේ නියාමන අධිකාරිය" යන්නෙන්, අදාළ බැංකුවේ කොළඹ වරාය නගරය ශාඛාවේ මව් අස්තිත්‍වය පිහිටුවා ඇති රටේ බැංකු ක්ෂේත්‍ර නියාමන අධිකාරිය අදහස් වේ;

"අක්වෙරළ බැංකු ව්‍යාපාරය" යන්නට, පනතේ දක්වා ඇති අර්ථයම තිබිය යුතු ය;

"මව් අස්තිත්‍වය" යන්නෙන්, පනත යටතේ කොළඹ වරාය නගරය ශාඛාවට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට සුදුසුකම් ලබාදෙන බැංකු බලපත්‍රය දරන අස්තිත්‍වය අදහස් වේ;

"2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ සහ සෙසු අනුමැතීන් සඳහා වූ නියෝග" යන්නෙන්, 2022 සැප්තැම්බර් මස 28 වන දින අංක 2299/46 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ සහ සෙසු අනුමැතීන් සඳහා වූ නියෝග අදහස් වේ;

"අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යන්නෙන්, (සංශෝධිත පරිදි) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද සහ 2022 මාර්තු මස 11 වන දින අංක 2270/66 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති අදහස් වේ;

"වාසික තැනැත්තා" සහ "නිර්වාසික තැනැත්තා" යන්නට, පනතේ දක්වා ඇති අර්ථයම තිබිය යුතු ය; සහ

"ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" යන්නෙන්, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 39 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය අදහස් වේ.

EOG 07-0271

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.